වර්ෂ 2019ක් වූ ඔක්තෝබර් මස 10 වන දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ හා ඖෂධ පනතේ 17 (1) වගන්තිය සමග කියවිය යුතු 38 (1) (ආ) වගන්තිය යටතේ විලවුන් නියාමනය කිරීම සම්බන්ධයෙන් වන විධිවිධාන.

ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වන මා විසින් මෙම විධාන වර්ෂ 2021ක් වූ මාර්තු ..... දින සිට බලාත්මක වන බව මෙමගින් දන්වා සිටිමි.

වෛද්‍ය කමල් ජයසිංහ
ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

වර්ෂ 2021ක් වූ මාර්තු මස ..... වන දින දීය
කොළඹ දී ය.

විධාන

1. මෙම විධාන 2021 විලවුන් (ප්‍රචාරය කිරීමේ) විධාන යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම විධාන 2021.------ වන දින සිට බලාත්මක වේ.

3. කිසිදු තැනැත්තකු විසින් යම් විලවුන් කිසිවක් ඊ උපලේඛනයේ දක්වා ඇති යම් රෝග, ආබාධ හෝ අසාමාන්‍ය කායික තත්ත්වයන් සඳහා ප්‍රතිකාරයක්, නිවාරණයක් හෝ සුවයක් වශයෙන් කිසිදු තැනැත්තකු විසින් ප්‍රචාරය නොකරනු ලැබිය යුතුය.

4. කිසිදු තැනැත්තකු විසින් බලධරයා වෙත ලියාපදිංචි නොකරන ලද කිසිදු විලවුන් වර්ගයක් ප්‍රචාරය කිරීම නොකළ යුතුය.

5. කිසිදු තැනැත්තකු විසින් යම් විලවුන් වර්ගයක් පිළිබඳව අසත්‍ය හෝ අතිශයෝක්තියෙන් වූ ගුණ වර්ණනා කිරීම හෝ එවැනි ගුණ වර්ණනාවක් තහවුරු කිරීම සඳහා පර්යේෂණ වල ප්‍රතිඵල හෝ විද්‍යාත්මක ලිපි ලේඛන වලින් උපුටාගත් කොටස් හෝ අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

6. පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක විධිවිධාන වලට පටහැනි කවර හෝ දැන්වීමක් ප්‍රසිද්ධ කිරීම, කරුණු දැක්වීමට දැන්වීම්කරුට අවස්ථාවක් දීමෙන් අනතුරුව බලධරයා විසින් තහනම් කල හැකිය.

5. කිසිදු තැනැත්තකු විසින් යම් විලවුන් තත්ත්වය, සංයුතිය හෝ සුරක්ෂිතතාවය සම්බන්ධ සාවද්‍ය, නොමග යවන සුලු, වංචා සහගත හෝ වැරදි වැටහීමක් ලබා දෙන ආකාරයට යම් විලවුන් කිසිවක් ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින් අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව විලවුන් කිසිවක් ප්‍රචාරණය හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතුය.

   එසේ වුව ද දැනටමත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් විලවුන් කිසිවක් සම්බන්ධයෙන් ප්‍රචාරය වෙමින් පවතින වෙළඳ ප්‍රචාරණයන් මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනයේ සිට මසක කාල සීමාවක් තුල අනුමැතිය සඳහා නියමිත ආකෘති පත්‍රයට අනුව නියමිත ගාස්තු ගෙවා අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.

   අධිකාරිය විසින් විධිමත් පරිදි ලැබී ඇති අයදුම්පත් සලකා බැලීමෙන් අනතුරුව අධිකාරියේ තීරණය හෝ අනුමැතිය ප්‍රායෝගිකව හැකි ඉක්මනින් අදාල ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතුය.

7. මෙම නියෝග උල්ලංඝණය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, ඒ අනුව කිසිදු දැනුම්දීමකින් තොරවම අදාල විලවුන් සම්බන්ධ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කල යුතුය.

DRAFT